සියළුම හිමිකම් ඇවිරිණි]
All Rights Reserved ]

# පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගය

## I පත්‍රය

## නැණ ලොවට පා තබන හපනුන්ට මඟ කියන "අදිති"

1

පැය 01 යි

විභාග අංකය ..............................


**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**


- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.


| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |


| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක** ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක** පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක** ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක** අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදිය. | V/I/S/CH |

01. කොටුව තුළ ඇති චිත්‍රයට වඩාත් සමානවන සේ ඇඳ ඇති චිත්‍රය කුමක් ද ?











1. 2. 3.

02. A රූපයට සමාන රූපයක් ලබා ගැනීම සඳහා B රූපයේ සිදුකළ යුතු වෙනස්කම් ගණන කීය ද?



A රූපය





B රූපය


1. 2 කි. 2. 3කි. 3. 4කි.


● අංක 3 සහ 4 ප්‍රශ්නවල කොටුව තුළ ඇති කාණ්ඩයට ඇතුළත් කිරීමට වඩාත් ගැළපෙන රූපය කුමක් ද ?

03.













1. 2. 3.

04.










1. 2. 3.

05. මෙම රූපය නිවැරදි ව සම්පූර්ණ කිරීමට වඩාත් ම සුදුසු රූප කැබැල්ල කුමක් ද?









1. 2. 3.

06. අන්තර් සම්බන්ධතාවයක් දැකිය නොහැකි වචන ඇතුළත් කොටුව තෝරන්න.

| 1. | 2. | 3. |
|---|---|---|
| මල්<br>පරාගනය<br>ඵල | පොල්<br>හිරමනය<br>කිරි | නිවස<br>පාසල<br>බැංකුව |

07. ආදේශන සම්බන්ධතාවයක් දැකිය හැකි වචන ඇතුළත් කොටුව තෝරන්න.


| 1. | 2. | 3. |
|---|---|---|
| කළය<br>බූලිය<br>ලබුකැටය | ක්‍රිකට්<br>පාපන්දු<br>නෙට්බෝල් | පෑන<br>පැන්සල<br>පොත |

08. පහත කවියෙන් කියැවෙන්නේ කුමක් පිළිබඳව ද?

උදයට පායා සවසට බැසයන
රශ්මිය විහිදා ලොවට එළිය දෙන
ගමන් කරන්නේ නැති යයි පැවසෙන
පුදුම වස්තුවකි හැමට ම සෙත දෙන

1. වලාකුළු 2. හිරු 3. සඳ

09. පහත රූපවලින් දක්වා ඇති ද්‍රව්‍ය කිසියම් හේතුවක් නිසා කාණ්ඩ තුනකට වෙන් කළ හැකිය.



A B C D E F

එම කාණ්ඩ තුන නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

1. A C / B E / D F
2. A F / B E / C D
3. A D / B E / C F

10. ආදිත්‍යගේ දැන් වයස අවුරුදු 15 කි. ඔහු ඔහුගේ සහෝදරයා මෙන් තුන් ගුණයක් වයස ය. තව අවුරුදු තුනකින් ආදිත්‍යගේ සහෝදරයාගේ වයස අවුරුදු කීයද?


1. අවුරුදු 8   2. අවුරුදු 45   3. අවුරුදු 48

11. දින 31 ඇති එක්තරා මාසයක පළමුවැනිදා සඳුදා දවසකි. එම මාසයේ බදාදා දිනයන්ගේ එකතුව කීය ද?

1. 75   2. 80   3. 85


- අංක 12 සහ 13 ප්‍රශ්නවල දැක්වෙනසංඛ්‍යා රටා තේරුම්ගෙන හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.

12.





1. 9   2. 18   3. 27

13.





1. 5   2. 7   3. 1

14 පහත රූපයේ දැක්වෙන ඝන වස්තුවේ ඇති මුහුණත් ගණන කීය ද?




1. 10   2. 9   3. 8


15. මුළු රූපයේ වටේ දිග, අඳුරු කළ රූපයේ වටේ දිග මෙන්




1. දෙගුණයකි
2. තුන් ගුණයකි
3. හතර ගුණයකි

- පහත මිල සටහන් ඇසුරෙන් අංක 16 සිට 17 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.







රු. 56.00 රු. 90.00 රු. 114.00

16. කෙසෙල් ඇවරියක මිල කීයද ?

1. රු. 32.00 2. රු. 58.00 3. රු. 24.00

17. අඹ ගෙඩි දෙකක් මිලට ගෙන රු. 50.00 දුන් අයෙකුට ලැබෙන ඉතුරු මුදල කීය ද?

1. රු. 26.00 2. රු. 24.00 3. රු. 10.00

18. නිවැරදි අක්ෂර වින්‍යාසයකින් යුක්ත වන වචන කාණ්ඩයක් සහිත පිළිතුර තෝරන්න.

1. කම්මැළි, ගැහැනිය, ගමරාල

2. ගැටළුව, පිළිවෙල, පුස්තකාලය


3. ගෝණා, ගොවිපළ, කැළණි

19. හිස්තැන්වලට ගැළපෙන වචන අයත් පිළිතුර තෝරන්න.

...................................... අනතුර දුටු ප්‍රදේශවාසීහු ................................ පත් වූහ.

1. විස්මිත, සන්තාපයට 2. බිහිසුණු, ශෝකයට 3. දරුණු, සොම්නසට

20. පහත රූපයේ තිබෙන ත්‍රිකෝණ ගණන කීය ද?



1. 4 2. 5 3. 6

21. පහත දැක්වෙන්නේ නදුල උදෑසන මිදුලට බැස ගත් ඡායාරූපයකි. එය නිරීක්ෂණය කර නදුල ගමන් කරන දිශාව කුමක්දැයි දී ඇති පිළිතුරු අතරින් තෝරන්න.



1. උතුරු දිශාව

2. නැගෙනහිර දිශාව

3. දකුණු දිශාව

22. ලිවිනු සහ සුපුන්ගේ බරෙහි එකතුව $48\ kg$ කි. ලිවිනු සුපුන්ට වඩා $6\ kg$ බරින් වැඩිය. මේ අනුව සුපුන්ගේ බර විය හැක්කේ,

1. $27\ kg$ 2. $21\ kg$ 3. $18\ kg$


23. පැන්සල් දෙකක් රු. 25.00 කි. ඒ අනුව පැන්සල් 3ක මිල වන්නේ,

1. රු. 75.00 2. රු. 37.50 3. රු. 50.00

24. ලණුවක් සමාන කොටස් ලැබෙන සේ ස්ථාන තුනකින් කපන ලදී. ඉන් එක් කැබැල්ලක දිග $25\ cm$ ක් නම් කැපීමට පෙර ලණුවේ මුළු දිග කොපමණ ද?

1. $1\ m$ 2. $75\ cm$ 3. $125\ cm$

- $A, B, C$ භාජන තුනක ජලය දමා ඇති ප්‍රමාණයන් පහතින් දැක්වේ. ඒ අනුව අංක 25, 26 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.





25. $A$ හා $B$ භාජන දෙකේ ජල පරිමාව කොපමණ ද?

1. $1\ l\ 800\ ml$ 2. $450\ ml$ 3. $1300\ ml$

26. $A$ හා $C$ භාජන දෙකේ ජල පරිමාව සමාන වීමට $C$ භාජනයේ කොපමණ ජල ප්‍රමාණයක් $A$ භාජනයට දැමිය යුතුද ?

1. $50\ ml$ 2. $100\ ml$ 3. $150\ ml$

27. දිග, පළල, උස $12\ cm$ බැගින් වූ ඝනකයක හැඩය ගත් පාර්සලයක් වටා පහත රූපයේ පරිදි ඇලවුම් පටියක් යොදා ඇත. එහි මුළු දිග සෙන්ටිමීටර කීයද ?



1. $48\ cm$
2. $96\ cm$
3. $72\ cm$

28. තිළිණි ළඟ තිබූ මුදලට වඩා රු. 50ක් වැඩියෙන් නෙතුලි ළඟ තිබුණි. නෙතුලි රු. 25ක් තිළිණිට දුන් විට,

1. තිළිණි ළඟ ඇති මුදල නෙතුලි ළඟ ඇති මුදලට වඩා වැඩිවේ.
2. නෙතුලි ළඟ ඇති මුදල තිළිණි ළඟ ඇති මුදලට වඩා වැඩිවේ
3. දෙදෙනාම ළඟ ඇති මුදල සමාන වේ.

- අංක 29 සහ 30 ප්‍රශ්නවලට විස්තරවන අවස්ථාව හොඳින් නිරූපණයවන යෙදුම කුමක්ද?

29. හරිහම්බ කරගත් සියල්ල ගංවතුරට ගසාගෙන ගිය සුනිමල් මහතා අමතා පාසලේ මුල් ගුරුතුමා මෙසේ පැවසුවේ ය.

**<u>සුනිමල්, ඔබ හැබෑම දක්ෂයෙක්. උගත් ශිල්ප බොහෝමයි. එයින් ම ඔබේ පවුලේ අනාගතය ගොඩනගා ගත හැකිය.</u>** ධෛර්ය වන්තව වැඩ කරමු.

1. ඇඟිල්ලේ තරමට ඉදිමෙන්න
2. උගතමනා ශිල්පය ම යි මතු රැකෙනා
3. ඇවිලෙන ගින්නට පිදුරු නොදමන්න.

30. අලිවැට කඩා වන අලි රංචුව ගම්වැදි පුවත ඇසූ අපි **<u>දැඩිසේ බියට පත්වීමු.</u>**

1. අනූනවයෙන් බේරුණා
2. හීන් දාඩිය දැම්මා
3. ඇඟ බේරා ගන්නවා

- පහත දැක්වෙන්නේ ගොවිපළක සිටින සතුන් ගණන පිළිබඳ තොරතුරු දැක්වෙන සටහනකි. ඒ ඇසුරෙන් 31, 32 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| සතුන් වර්ගය | සිටින සංඛ්‍යාව |
|---|---|
| ගවයින් | එළුවන් ගණන මෙන් දෙගුණයකි |
| කුකුළන් | 214 |
| එළුවන් | කුකුළන් ගණන මෙන් $\frac{1}{2}$ |

31. ගොවිපළේ සිටින ගවයින් ගණන කීයද?

1. 214
2. 428
3. 107

32. වගුවට අනුව ගොවිපළේ සිටින මුළු සතුන් ගණන කීයද?

1. 428
2. 535
3. 214

- පහත විස්තරය අනුව අංක 33, 34, 35 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

4 ශ්‍රේණියේ සිසුවෙකු ඔහුගේ සිංහල, ගණිතය, ඉංග්‍රීසි, දෙමළ හා පරිසරය පොත් එකමත එක තබා ගොඩගසා තිබුණේ පහත පරිදිය.



- ඉංග්‍රීසි පොතට අසලින් ම ඇති සිංහල පොත ඉවතට ගතහොත් යට සිට තුන්වන පොත ඉංග්‍රීසි පොත වේ.
- දෙමළ පොතට උඩින් තවත් පොත් නැත.
- පරිසරය පොත ගණිතය පොතට හා සිංහල පොතට ස්පර්ශ වේ.

33. යටින් ම තබා ඇති පොත කුමක්ද ?

1. සිංහල පොත 2. ගණිතය පොත 3. ඉංග්‍රීසි පොත




34. යට සිට හතරවෙනියට තබා ඇති පොත කුමක් ද ?




1. සිංහල පොත 2. දෙමළ පොත 3. ඉංග්‍රීසි පොත

35. ඉංග්‍රීසි පොත මැදි වී ඇත්තේ කුමන පොත් දෙකට ද?

1 දෙමළ හා සිංහල පොතට 2. සිංහල හා ගණිත පොතට 3. පරිසරය හා ගණිතය පොතට

- පහත රූප අතරින් වෙනස් රූපය තෝරන්න.


36. 1.  2.  3. 

37. 1.  2.  3. 

38. ශිෂ්‍යයෙක් පුස්තකාලයෙන් ගත් පොත් පිටුවලින් $\frac{1}{4}$ ක් කියවා අවසන් කර තිබුණි. කියවූ පිටු ගණන 12 ක් නම් කියවීමට ඉතුරුව ඇති පිටු ගණන කීයද?

1. 36 2. 24 3. 48

39. රාධා ජල පරිමාවක් ගෙන සමානව කොටස් 4කට බෙදා විවිධ හැඩයෙන් යුත් භාජන 4කට දමන ලදි. එම භාජන ඇගේ නංගීට පෙන්වා එහි අඩංගු ජල පරිමාවන් පිළිබඳ නංගි ලබා දුන් පිළිතුරු සටහන් කළාය. එයින් නිවැරදි පිළිතුර කුමක් ද ?




1. *B* භාජනයේ ජලය වැඩිපුර ඇත.
2. *D* භාජනයට වඩා C භාජනයේ ජලය වැඩිපුර ඇත.
3. B හා D භාජන දෙකේ ඇති ජල පරිමාවත් A හා C භාජන දෙකේ ඇති ජල පරිමාවත් සමාන වේ.

40. ගොඩනැගිල්ලක බිම් මහලෙන් සෝපානය පිටත් වෙද්දී එහි පුද්ගලයෝ 6 දෙනෙක් සිටියහ. දෙවන මහලේ දී දෙදෙනෙක් බැස ගිය අතර තිදෙනෙක් ඊට ඇතුළු වුහ. තුන්වන මහලේ දී දෙදෙනෙක් ඇතුළු වු අතර සිවුවන මහලේ දී 4 දෙනෙක් බැස්සාහ. පස්වන මහලේ දී ඉතිරි සියලු දෙනාම බැස ගියේ නම් එම ගණන කීය ද ?

1. 4 2. 5 3. 6